






ශ්‍රී. බු. ව. 2559 ක්වූ නවම් මස කලාපය, රාජ්‍ය වර්ෂ 2016 ක් වූ පෙබරවාරි මස 22 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති

ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.


**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# නොදියුණු සිත කාමයෙහි ඇලෙයි දියුණු සිත කාමයෙහි නොඇලෙයි

( ජාතක පාළිය භිස ජාතකය ඇසුරිනි)

**ධර්මකාමී පින්වතුනි,**

**අද නවම් මස මැදි පොහෝ දිනයයි. සැරියුත් මුගලන් මාහිමිවරු රහත් වීම, ගෞතම සම්බුදු සසුනෙහි අග්‍රශ්‍රාවක තනතුරු පිරිනැමීම, ප්‍රථම සංඝ සම්මේලනය සිදු කිරීම. අවවාද ප්‍රාතිමෝක්ෂය දෙසීම. භාග්‍යවතුන් වහන්සේ**

ආයුසංස්කාරය හැරීම වැනි හේතූන් නිසා නවම් මැදි පෝය විශේෂයට පත්වේ. මෙම දහම් පණිවුඩය සඳහා මාතෘකා වශයෙන් අපට ඉතා වටිනා ආදර්ශයක් දෙන ජාතක දේශනාවක් පාදක කර ගතිමි. එනම් ජාතක පාලියෙහි ප්‍රකීර්ණක නිපාතයෙහි 488 වෙනි ජාතක දේශනාව වන භිස ජාතකයයි. භිස යනු නෙළුම් අල සඳහා යෙදෙන පාළි වචනයයි. නෙළුම් අල හේතු කරගෙන මේ ජාතක කතාව ගොඩනැගිල තිබෙනවා. ජාතක දේශනාවක අතීත හා වර්තමාන යනුවෙන් කතා දෙකකි. මෙහි වර්තමාන කතාවට හේතු වනුයේ භාග්‍යවතුන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩසිටි අවස්ථාවේ ශාසනයෙහි ක්‍රියාකාරිත්වයෙන් දුර්වලවූ (උකටලී වූ) කෙලෙස් වසඟ වූ භික්ෂුන් වහන්සේ නමක් හේතු කරගෙනය. ශාසනය යනු හැමට පොදු කරුණු තුනකි. ( 1 ) සියලු පව් වලින් වැළකීම. (2) කුසලය වැඩි දියුණු කීරිම. (3) සිත පිරිසිදු කිරීමයි. මෙම ක්‍රියා තුනෙන් යමෙක් වැළකී (ගිහි හෝ පැවිදි) සිටී නම් ඔහු ශාසනයෙහි උකටලී වුවෙකු යයි කියති. ඒ අරමුණු කර භාග්‍යවතුන් වහන්සේ සද්ධර්මයෙහි යෙදෙන උත්තමයෝ පෙර අබුද්ධෝත්පාද කාලයේ පවා පැවිදිව ගුණ ධර්‍ම පුරා ඇති බවත් දැන් බුදුවරයෙකු පහළවීත් එයින් වැළකී සිටිම. ඥානවන්ත ලක්ෂණයක් නොවන බවට අවවාද කරමින් අතීත කතාව වදාළහ.

පෙර අප මහා බෝසතාණන් වහන්සේ අසූකෝටියක් ධනය ඇති බමුණු පවුලක උපත ලදහ. පුතුන් සත් දෙනෙකි වැඩිමහලු පුතා කංචන බාල සහෝදරිය කාංචනා දේවියයි. කංචන කුමරු කල වයස් පැමිණි හෙයින් දෙමාපියෝ විවාහ යෝජනා කළහ. ඒ කුමරු සසර පුරුද්දෙන් පස්කම් සුවය දකිනුයේ ගිනිකන්දක්, හිර ගෙදරක්, අශූචියෙන් පිරි බිමක් ලෙසටය. එසේ සිතා විවාහ වීමට අකමැතිව පැවිදි වීමට අදහස් කළේය. අනිත් උපකංචන කුමරු ඇතුළු කුමරුන් සය දෙනාද කුමරියද ඒ තීරණයටම පැමිණ දෙමාපියන් ජීවත් වන තුරු ගිහිව සිට වනගතව තවුස් පැවිද්ද ලැබීය. මේ සඳහා තවත් මෙහෙකාරියක්, මෙහෙකරුවෙකු, මිතුරෙකුද, එක්විය. පිරිස එකොළොස් දෙනෙකි. වනගත ආහාරයෙන් යැපිනි. තාපස ගුණ ඉතා හොඳින් රැකිනි. උග්‍ර තපස් රැකි මේ පිරිස දුටු ශක්‍ර දේවේන්ද්‍රයා සීලය පරීක්ෂා කීරිමේ අදහසින් නායක තාපසතුමාට ආහාර වශයෙන් වෙන්කර තිබූ නෙළුම් අල කොටස දින තුනක්ම සඟවා තැබීය. තෙදිනකට පසු පිරිසගෙන් විමසුව තමන්ට ආහාර නොතැබීම ගැන, ඔවුන් කීවේ අප විසින් ඔබතුමාට පුරුදු පරිදි බෙදා තැබූ බවයි. උප කංචන තාපසතුමා ඇතුළු තාපසවරු 8 දෙනා ද තාපසවරියන් දෙදෙනාද පැමිණි වෘක්ෂ දේවතාවෙක්ද, ඇතෙක්ද, වඳුරෙක්ද, වශයෙන් නායකතුමාට තම නිර්දෝෂ භාවය හැඟවීමටත්, යමෙක් මේ වරද කොට තාපස

පිරිසේ සමගිය බිඳවීමට උත්සහ කළේ නම් ඔහුට පාඩමක් පිණිසත්  ශාප කිරීමක් කළේය.

උපකංචන තාපසතුමා,''බමුණුතුමණි යමෙක් ඔබ වහන්සේගේ නෙළුම් අල සොරකම් කළේද ඔහුට රන් රිදී මුතු මැණික් සහ හිතවත් බිරිඳක්ද දරුවන්ද ලැබේවා ගවමහීෂාදී  සම්පත් ලැබේවා.

තුන්වන තාපසතුමා, ''නායකතුමනි මේ වරද යමෙක් කළේ නම් ඔහුට කාම සම්පත් කෙරෙහි තදබල අපේක්ෂා ඇතිව බොහෝ දරුවෝද මල් මාලා කසීරට සඳුන් භාවිතා කරන යස ඉසුරින් පිරි කෙනෙකු වේවා.''

සිව්වෙනිතාපසතුමා, ''මේ වරද කළ ඔහුට වයස ගියත් ඒ බව නොපෙනෙන ගිහියෙක්ව බොහෝ ධන ධාන්‍ය ඇති සී සෑම් ආදී කර්මාන්ත කරන පිරිවරද පුතුන්ද හැම කාම සම්පත්තියක්ම ඇති ධනවතෙක් වේවා.''

පස්වන තාපසතුමා, ''  ඔහු සතර මහා සාගර සීමා කරගත් පෘථිවියට අධිපති වූ රජුන්ටත් රජ වූ පරිවාර සම්පත් ඇති බලාත්කාරකමින් යුක්ත වූ රජකුල උපන්  රාජ්‍ය නායකයෙකු වේවා.''

හයවෙනි තාපසතුමා, '' නායකතුමනි ඔහු සුභ හෝරා නැකැත් පිළිබඳ හසල දැනුමකින් යුතු ජ්‍යොතිෂයෙහි තදබල ආශා ඇතිව පිරිවර ඇති රජවරුන්ගේ නැකැත් හදන ඔවුන් විසින් ගෞරව විශ්වාස කරන රාජකීය ජෝතිෂඥයෙකු හෙවත් බමුණු පඬිවරයෙකු වේවා.''

හත්වන තාපසතුමා, ''තාපසතුමනි මේ වරද යමෙක් සිදුකලේ නම් ඔහු මන්ත්‍ර ශාස්ත්‍රය දන්න සතරවේදය සම්පූර්ණයෙන් ඉගෙනගත් තාපසයෙකු ලෙසට ලෝ වැසියා සිතනු ලබත්වා ජනපද වාසීන්ගේ ගෞරව වන්දනයට ද භාජනය වේවා. ''

අටවෙනි තාපසතුමා,'' යමෙක් ඔබතුමාගේ නෙළුම් අල සොරා කෑවෙහි නම් ඔහු කරුණු සතරකින් එනම් ශක්‍රයා දුන්නා වැනි වූ බෝහෝ පිරිසද බොහෝ ධාන්‍ය සහ දර ද  ජලය ද (වැව් අමුණු ජලය) යන සතරින් අඩු නැතිව සශ්‍රීක වූ ගම්වරයක් ලැබ එම ගම්වරය අඩු නැතිව අනුභව කිරීමට ලැබේවා එම සැප කෙරෙහි ආශා ඇතිවම ඔහු මරණයට පැමිණේවා. ''

නවවෙනි තාපසතුමා, ''තාපසතුමනි ඔබගේ නෙළුම් අල කොටස සොරා ගත්තවුන්ට නොයෙක් සැපතින් පිරුණු ගම් දෙටුවෙක් (ගම් පතියෙකු) වේවා. ඔහුට යහළුවන් බොහෝ වේවා ඔවුන් සමග නැටුම් ගැයුම් වැයුම් වලින් ප්‍රීති වීමෙනුත් අඩු නොවේවා. රජුගෙන් ඔහුට කිසිදු ව්‍යසනයක් බාධාවක් නොවේවා.''

තාපසතුමිය (සහෝදරිය), නායක තාපසතුමනි ඔබතුමාගේ ආහාර කොටස යම් ස්ත්‍රියක් සොරාගත්තේ නම් මහා තෙද ඇති රජෙකු සියළු පොලොව ජයගෙන තම බිසෝවරු දහසකට නායක තනතුරෙහි තබා මහත් රජ සැපතින් අගතැන්පත් කරත්වායි සපථ කළේය.''

එකොළොස් වැනි තාපසතුමිය, (මෙහෙය සඳහා පැමිණි දාසිය) නායකතුමනි ඔබතුමා හිමි ආහාර කොටස යම් තැනැත්තියක් ගත්තී නම් ඕ තොමෝ රැස්වූ අධිපතින් (ස්වාමිවරු) මැද හිඳ කිසිදු පැකිලීමක් නැතිව ආහාර ගැනීමට ද ලාභය සඳහා කුහක කම් කරන්නෙකුද වේවායි ශාප කළේය. (වැදගත් යයි සම්මත සේවිකාවක් අකමැතිම ක්‍රියාවකි.)

මෙසේ හැමෝම දිවුරා අවසන් වු පසු අසළ රුක් දෙවියෙක් පැමිණ ඔබතුමාගේ නෙළුම් අල යමෙක් සොරකම් කළේද ඔහු නගරයේ මහ වෙහෙරක සැමදා නව විහාර කර්මාන්ත කරන මහ තෙරුන් වහන්සේ කෙනෙකු වේවා.

මේ අතර මිනිසුන් විසින් වැඩගත් ඇතෙකු බැම්වලින් මිදී තාපසවරු ළඟට විත් කල්ගත කරන අතර මෙයින් කම්පා වී යමෙක් ඔබට වෙන් කරන ලද ආහාර සොරා ගත්තේ වී නම් ඔහු මා වැනි ලණු සීයකින් පමණ හයපොලකින් බැම් දමා හෙණ්ඩුවෙන් පහර දී නොයෙක් වද බන්ධන කර රාජධානියට ගෙන ගොස් ගම් ඇතුන් අතරට පත් වේවායි පෙර තමන් වින්ද දුක් සිහි කොට ශාප කළේය.

එය දුටු අහිකුණ්ඩිකයින්ගෙන් මිදී ආ එහි රැඳී සිටි වඳුරෙකුද තාපසතුමනි ඔබතුමාගේ නෙළුම් අල යමෙක් සොරාගත්තේ නම් ඔහුට මල් මාලා පළඳවා කණ විද ඊයම් ආභරණ පළඳවා ලීයකින් තල තලා සර්පයන් ඉදිරියට අදිමින් නටවන වානරයෙක් වේවායි සපථ කලේය.

ඉහත කී දහතුන් දෙනා දිවුරා අවසන් වූ පසු මහා බෝසතාණන් වූ මහා කංචන තාපසතුමා සිතනවා මෙසේ මේ හැමදෙනාම සත්‍යවාදීව සීලගුණයෙන් දිවුරා කියද්දීත් නැති නොවූ දෙයක් නැති වූවායයි මා විසින් කියනු ඇතැයි සැක සිතනු ඇත එබැවින් මමත් සපථ කරම් යි මේ භයානක වූ සසරට මලකඩයක් බඳු වූ පංචකාම ගුණයෙහි බැඳී ගිහිගෙයිදීම මරණයට පැමිණෙත්වා යි සපථ කළහ.

සක් දෙවිඳු මේ සියල්ල අසා මෙවැනි බරපල ශාප කිරීමක් මින් පෙර අසා නැති බැවින් තම නියම ස්වරූපයෙන් පෙනීසිටිමින් නායක තාපසතුමාට මෙසේ පවසනවා තාපසතුමනි දිව්‍ය මනුෂ්‍ය ආදී සත්වයෝ ලොව සැමදා ඉතා ප්‍රියවූ වස්තුකාම ක්ලේශකාම සොයමින් හැසිරේද ඒ සම්පත් හැමදෙනාටම ප්‍රියයි

මනාපයි.එනමුත් මේ පිරිස ඒ හොඳයිකියා වැඩියෙන් ලැබේවායි කියා ප්‍රාර්ථනා කරන දේ මේ ශාප කිරීමට උපයෝගී කළා මේ කාම සම්පත් සඳහා මේ තරම් නින්දා කිරීමට හේතුව කුමක්දැයි විමසීය.

ඊට පිළිතුරු දෙන බෝසතුන් වහන්සේ සක්දෙව් රජුනි කාමයන් නිසා සත්වයෝ ප්‍රියමනාපදේ ලබා ගැනීමත් අකමැති දෙයින් ඈත් වීමටත් නිතර සිතති. ඇස, කණ, නාසය, දිව, ශරීරය පිනවීමටම හුරුවී ඇත. එහි සීමාවක් නැත. ඒ සඳහා පරපණ නසති. හොරකම් කරති කම් සුව වරදවා විඳිති. බොරු කියති. දඬු මුගුරු ආදියෙන් සත්වයා පෙලති. ඒ නිසාම බිය හට ගනිති.ඒ බියආකාර සතරකි. අතතානුවාද භය(තමා තමාට දොස් කියාවි යන බිය) පරානුවාද භය (අනුන් විසින් දොස් කියාවි යන බිය) දණ්ඩ භය(දඩුවම් ලබන්නට වේය යන බිය) දුගගති භය (දුගතියේ උපදින්නට වේවි යන බිය) වශයෙනි කාමය නිසා ඒ භය හට ගෙන නිතර තැති ගැනීමෙන් වාසය කරති. ඒ නිසාම දුක හට ගනී. මෝහය නිසා තව තවත් පව් කරති. එම පාපකර්‍ම නිසා මරණින් පසු දුගතියෙහි උපදී එබැවින් සක් දෙව් රජුනි තාපසවරු කාමයන් අගය නොකරති. එසේ කාමය ප්‍රිය කරන්නෝ මෙලොව සහ පරලොව දුක් විඳී. මේ කාමයට ඇති ආශාව අත්හැරිය යුතුය. කාමයට නිග්‍රහ කළ යුතුයි පැවසීය. එම අනුශාසනාවට කන් දුන් සක් දෙවිඳු තැති ගෙන තාපසතුනි ඔබ වහන්සේලා පංචකාම සම්පත්හි ඇලීද නොඇලී දැයි සැක හැර දැන ගැනීම සඳහා නුඹ වහන්සේ සතු නෙළුම් අල සැඟවීම් මේ තාපසවරුන්ගේ එම නිශ්පාපී ගුණය ප්‍රත්‍යක්ෂ වීම්. මහ බෝසතුන් විසින් සක් දෙවිඳුට සමාව දෙන ලදී. සක් දෙව් රජු දෙව් ලොවට ගියාය. තාපසවරු ධ්‍යානවඩා බ්‍රහ්ම ලොව උපන්හයි. වදුරා උකටලී භික්ෂු සංඝයා වහන්සේට චතුරාර්‍ය්‍ය සත්‍යයෙන් දිරිගන්වා සෝවාන් ඵලයෙහි පිහිටුවා වදාළහ.

කාම සම්පත් යනු අපේ ඇස, කණ, නාසය, දිව, ශරීරය යන එම ඉන්ද්‍රියන් පිනවීමට ගොදුරු කර ගන්නා වස්තූන්ය. ඒවායේ සීමාව ඉක්මවා ඇලීම නිසා දුකට පත්වේ එබැවින් ඒ පිලිබඳ අවබෝධයෙන් තිදොර සංවර කර ගැනිම හැර එම දුකෙන් මිදීමට වෙනත් මඟක් නැත. බුදුරජාණන් වහන්සේ යමෙක් කාමයෙහි සීමාව ඉක්මවා නැවත නැවත යෙදේද, දුකට හේතුවන අවැඩටම හිත වූ එම කාමය නොසෙවිය යුතු යැයි වදාළහ. උපන් සත්වයා එම පංචකාමය ඇසුරු කොට දිවි පැවැත්ම කළ යුතුය. භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දෙනු ලබන්නේ එහි සීමාව නුවණින් දැක අවබෝධයෙන් සංවර වීමටයි. පසිඳුරන් පිනවීමේදී ඒ තුල ආස්වාදයක් තිබෙන නමුදු සතවයා එම ආස්වාදය තුල අනවශ්‍ය ලෙස ඇලෙන බැවින් ඒ ඇලීම හෙවත් උපාදානය කිරීමෙන් තමන් කැමති විදියට කාම සම්පත් පාලනය කිරීමට හිතනවා එවිට, පිං, පවු නොපෙනී යනවා එවිට අපට

හිතෙනවා අර තාපසවරු කොයිතරම් නිවැරදි ද යන්න එනමුත් මිල මුදල් දේපල මත්තේම බණ පදයකටවත් ඇහුම් කම් නොදී දිවි ගෙවන කාම භෝගී අයට එසේ සිතීමත් උගහටය. වර්තමානයේ ඉහත කී තාපසවරු එම ශාප කිරීම කළේ නම් ඒ ශාපය සඳහා අද ඇති කාම වස්තූන්ගෙන් උපයෝගී කර ගනුයේ මොනවාදැයි උන්වහන්සේලාට ද හිතාගන්නටවත් අපහසු වනු ඇත. භාග්‍යවතුන් වහන්සේ ආදර්ශයෙන් පෙන්වූයේ සැප සම්පත් තුළ සිරවීමට නොව නුවණින් දැක දුක අවබෝධ කර ගැනීමටය. අද අපි සාමාන්‍ය ජීවිතයේදී උදාහරණ ලෙස වසරක් ලබන විට, උපන් දින, වැනි අවස්ථාවලදී ප්‍රාර්ථනා කරනුයේ කිරියෙන් පැණියෙන් ඉතිරෙන නව වසරක් සුභ උපන්දිනයක් ඒ හැම හොඳයි ඒ සඳහා ප්‍රඥාව ද ඉතිරේවායි ප්‍රාර්ථනා කරන්නේ නම් කොයිතරම් යහපත්ද, ඉහකී තාපසවරු ශාප කිරීමට කාම සැප  ලැබේවායි පැතුවද ප්‍රඥාව පහළවේවායි කිසිතැනක ප්‍රාර්ථනා කරපු බවක් නැත. ඊට හේතුව  අප කරනුයේ ශාපයක් නොවන නිසාය ප්‍රඥාව සමඟ සැප උදා වේවායි නොපැතීම ප්‍රඥාවන්තයෝ හොරුන්ට සතුරන්ට කරනු ලබන සාපයට සමාන වනු ඇත. ඒ නිසා කිසිවිටෙක බුදුරජාණන් වහන්සේ විසින් අනවබෝධ යැදීම (යාඥාව) අනුමත කළේ නැත. ප්‍රඥා ගෝචරව පංචකාමය (භවය) භුක්තිවිඳ සසරින් එතෙර වීමට තම ශ්‍රාවකයාට මග පෙන්වා දුන්හ.

මේ දහම් පණිවුඩය ආරම්භයේදී උකටලී වූ හිමි නමක් ගැන සඳහන්වේ. අද අපි සැවොම ජීවත් වන්නේ බුධ ශාසනයක් පවතින මොහොතකදීය. ඒ හිමියන් මෙන්  අපිද  උකටලී වන්නේ බුදුවරයෙක් පහළ වී ඇති ධර්‍මය තවම පවතිද්දීමය "සබබ පාපසස අකරණං...." යනාදී ගාථාවෙන් අපට කියා දෙනුයේ ශාසනයේ ලක්‍ෂණ තුන නම් අප එහි යම් පමණකට හෝ නිරත විය යුතුය. නැතහොත් එහි විරුද්ධ පැත්ත වන සියලු පව් කිරීම් අකුසල් රැස් කිරීම හිත නරක් කර ගැනීම වනු ඇත.

අබුද්ධෝත්පාද කාලයක වුවද ප්‍රඥාවන්තයා නුවණින් දැක ලෝකය පරිහරණය කර ඇත. එදා ඒ තාපස පිරිසට  පව්දුරු කිරීමට කුසල් රැස් කිරීමට සිත පිරිසිදු කිරීමට වටපිටාව  තම සිතින්ම උදාකරගත් නිසා දේවතා රැකවරණයද ලැබුණා. ශක්‍රදේවේන්ද්‍රයාට ඒ ශාපය නොලැබුනේ ඔහු සීලය පරීක්‍ෂා කිරීම විනා කලේ සොරකමක් නොවන නිසාය. දෙව්ලොව උපන් සක් දෙවිඳු නෙළුම් අලසොරාට ගනුයේ කුමටද? මිනිස් ආහාර කිසිවිට දෙවියන්ගේ ආහාර නොවන බව මූලා නොවී ධර්‍මයෙන් ප්‍රඥාවෙන්ම තේරුම් ගත යුත්තකි.

මෙහිදී අප ගත යුතු ප්‍රධාන ධර්‍ම හරය වන්නේ බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි

" තණ්හා පච්චයාඋපාදනං" ආශාව නිසා කාම සම්පත් තදින් අල්ලාගන්නා බවත් "උපාදානපච්චයා භවො" අල්ලා ගැනීම හේතුකොට ගෙන සත්වයා භවගාමිව අපමණ දුක් විඳින බවත්ය. ඒ නිසා කාම සම්පත්හි මාත්‍රාව දැන ප්‍රඥාව මෙහෙයවා අප්‍රමාණ දුක් නැති කර ගනිමු.




